# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1932/52 - 2015 සැප්තැම්බර් මස 16 වැනි බදාදා - 2015.09.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

ජාතික ක්‍රීඩා සංගම් නියෝග මාලාවේ 54(3) වගන්තිය යටතේ විධානය

ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර වන මා විසින්, ශ්‍රී ලංකා ජූඩෝ සංගමයේ අතුරු පාලන කමිටු කාල සීමාව 2015.07.15 දිනෙන් අවසන් වී ඇති බැවින් නීත්‍යානුකූලව නිලවරණය නැවත පවත්වන තෙක් එම සංගමයේ කටයුතු මැනවින් පවත්වාගෙන යාම සඳහා නිසි බලධාරියා ලෙස ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන කලුදුර ද සිල්වා ශාන්ත රුවන්චන්ද්‍ර මහතා පත් කර ඇති බවට 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ජූඩෝ සංගමය වෙත මෙයින් දැනුම් දෙන අතර, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 41 වගන්තිය යටතේ 2013 අගෝස්තු මස 30 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදුව අංක 1825/38 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි 54 (3) වගන්තිය යටතේ සඳහන් වන ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ රෙගුලාසි ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව,

ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන කලුදුර ද සිල්වා ශාන්ත රුවන්චන්ද්‍ර මහත්මයාට ශ්‍රී ලංකා ජූඩෝ සංගමයේ නව නිලධාරී මණ්ඩලය තෝරා ගැනීමේ නිලවරණය කැඳවීම හා පැවැත්වීමට මෙයින් නියම කරමි.

නීතිඥ දයාසිරි ජයසේකර,
ක්‍රීඩා අමාත්‍ය.

2015 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

10 - 164